# ශිෂා (shisha) දුම්කොළ සංශෝධන

ප්‍රජාව වෙත කරුණු පත්‍රිකාවක්

මෙම කරුණු පත්‍රිකාව ශිෂා දුම්කොළ අලෙවිය, ප්‍රචාරණය සහ පාවිච්චිය හා සම්බන්ධ වික්ටෝරියානු දුම්කොළ පාලන නීති වල සාරාංශයකි.

## ශිෂා දුම්කොළ

ශිෂා දුම්කොළ යනු සාමාන්‍යයෙන් දුම්කොළ, උක්පැණි මණ්ඩි සමග පැසවා පලතුරු රසකාරක එක්කළ සංයෝගයකි. සාමාන්‍යයෙන් ශිෂා දුම්කොළ රට විශේෂ මිහිරි සහ පලතුරු-රසැති සුවඳක් සහිත වන අතර එය වතුරපයිප්පයක් හරහා දුම්බීම කරනු ලබයි.

ශිෂා, නාර්ගයිල් (nargile), හුකා (hookah), ආර්ගයිල් (arghile), ගොසා (goza) සහ හබල් බබල් (hubble bubble) යනු වතුරපයිප්පය හඳුන්වන වෙනත් සුලභ නම් සමහරක්ය.

## නීති වෙනස් කිරීම්

1987 දුම්කොළ පනත (*Tobacco Act 1987*) (දුම්කොළ පනත) යටතේ 2017 **අගෝස්තු** 1 වන දින සිට **ඕනෑම ප්‍රමාණයක්** දුම්කොළ අඩංගු ශිෂා දුම්කොළ අලෙවිය, ප්‍රචාරණය සහ පාවිච්චිය, සිගරට් සහ සුරුට්ටු වැනි අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත හා සමාන ලෙස සළකනු ලැබේ .

මේ වෙනස්වීම් අනුව ශිෂා දුම්කොළ:

- දුම් පානය තහනම් ස්ථාන වල පානය කිරීම තහනම් වේ
- වයස අවුරුදු 18 ට අඩු අයෙකුට විකිණීම තහනම් වේ
- අලෙවි කරන ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රචාරණය කිරීම තහනම් වේ
- වාහනයක් වැනි තාවකාලික ස්ථානයකින් විකිනීම තහනම් වේ
- ශිෂා හෝ උක්පැණි මණ්ඩි දුම්කොළ නිෂ්පාදිත අලෙවිය ප්‍රවර්ධනය කිරීම පිණිස දීම හෝ නොමිලයේ දීමට පිළිගැන්වීම තහනම් වේ.

මේ වෙනස්වීම් මධ්‍යම ආණ්ඩුවේ දුම්කොළ සරල ඇසුරුම් නීති සමගද පෙළ ගැසේ. එම නීති අනුව ශිෂා දුම්කොළ නිෂ්පාදිත, චිත්‍රක සෞඛ්‍ය අවවාද රූප සහිත අනිවාර්ය සරල ඇසුරුම් වල ඇසිරිය යුතු වේ.

දුම්කොළ අඩංගු නැති, පලතුරු හෝ ශාකමය නිෂ්පාදිත වලට මේ නීති ආදාල නොවේ.

## ශිෂා දුම්කොළ පානය තහනම් ස්ථාන

දුම්කොළ පනත යටතේ දුම් පානය තහනම් සෑම ස්ථානයකම ශිෂා දුම්කොළ පානය තහනම්ය.

කැෆේ අවන්හල්, විවේකාගාර සහ බලපත්‍ර සහිත පරිශ්‍ර වැනි ආවෘත සේවාස්ථාන මීට ඇතුළත් වේ.

2017 අගෝස්තු 1 වන දින සිට දුම් පානය තහනම පහත ස්ථාන වලටද බලපානු ලැබේ:

- එළිමහන් ආහාර අනුභව ස්ථාන
- එළිමහන් ආහාර අනුභව ස්ථාන වලට මීටර් 4ක් ඇතුලත එහි යම් කොටසක් හෝ අයත් වෙන, එළිමහන් පානය කරන ස්ථාන (අවම වශයෙන් මීටර් 2.1 ක් උස තාප්පයකින් එම ස්ථානය වෙන් කර නැත්නම්)

## වෙනස් කිරීම් වලට හේතු

2006 වසරේ සිට වික්ටෝරියාවේ ආවෘත සේවාස්ථාන ඇතුලත දුම් පානය තහනම් විය. දුම්කොළ **ප්‍රධාන** සංරචකය වන ශිෂා දුම්කොළ වලටද මෙම තහනම බලපායි.

ප්‍රජා සෞඛ්‍යය ආරක්ෂා කිරීමටත් දුම්කොළ ආශ්‍රිත අසනීප සහ රෝග අවම කිරීමත් පිණිස මෑතදී ශිෂා දුම්කොළ නීති දීර්ග කර ඇත.

අලුත් නීති වල අරමුණු:

- අන් කෙනෙකුගේ ශිෂා දුම්කොළ දුමට විවෘත (second-hand smoke) වීමෙන් ඇතිවන හානිකර ප්‍රතිඵල වලින් ශිෂා කැෆේ, විවේකාගාර වැනි ආවෘත සේවාස්ථාන වල සේවකයන් සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම
- වයස අවුරුදු 18 ට අඩු අය ශිෂා දුම්කොළ මිළදී ගැනීම සහ ලබා ගැනීම වැළැක්වීම
- මේ ආකාරයේ දුම් පානයට ආකර්ෂණය විය හැකි ළමුන් සහ තරුනයින් ශිෂා දුම්කොළ පානය පටන් ගැනීම වැළැක්වීම
- දුම් පානය අතහැරීමට උත්සාහ කරන අයට හෝ ලඟදී දුම් පානය අත්හල අයට උදව් වීම
- අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත පාලනය කර ඇති ආකාර සමග සංගතභාවය ඇතිකිරීම .

### සෞඛ්‍ය අවදානම්

ශිෂා දුම්කොළ පානය සහ එම දුමට විවෘත වීමෙහි හානිකර සෞඛ්‍ය අවදානම් ඇති බවට ප්‍රබල සාක්ෂි ඇත.

- ශිෂා දුම්කොළ පාවිච්චි කරන්නන් සහ අන් අයගේ ශිෂා දුම්කොළ දුමට විවෘත වුවන්, පෙනහලු පිළිකා, ශ්වසන රෝග, ගර්භණී

Victoria State Government
Health and Human Services

අවධියේ අඩු උපත් බර ඇතුලු, සිගරට් බීම හේතුවෙන් හටගන්නා නොයෙකුත් රෝග හටගැනීමේ අවදානමට ලක් වේ.

සිගරට් බීම වෙනුවට ශිෂා දුම්කොළ පානය නිරුපද්‍රුත විකල්පයක්ය යන පොදු වැරදි වැටහීමක් තිබේ.

මෙය අසත්‍යය.

සිගරට් බීම හා සසඳන විට ශිෂා දුම්කොළ පානය කරන්නන් ඊට සමාන හෝ ඊට ඉහල මට්ටමක හානිකර රසායන ද්‍රව්‍ය වලට විවෘත වේ.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, එක ශිෂා දුම් පානය වාරයකදී, සිගරට් 100ක් බීමෙන් ආඝ්‍රාණය කරන දුම් ප්‍රමාණයට සමාන දුම් ප්‍රමාණයක් ආඝ්‍රාණය කරණු ලැබේ.[1]

## දඬුවම්

මීට දඬුවම් සිගරට් සහ සුරුට්ටු වැනි අනෙකුත් දුම්කොළ නිෂ්පාදිත වලට ඇති දඬුවම් හා සමාන වේ.

උදාහරණයක් ලෙස, ආවෘත සේවාස්ථානයක් හෝ එළිමහන් ආහාර අනුභව ස්ථාන වැනි දුම් පානය තහනම් ස්ථානයක ශිෂා දුම් පානය කරන්නෙකුට  එක දඬුවම් ඒකකයක වටිනාකම ඇති දඩයක් ලැබීමට හැකිය.[2]

## වැඩිදුර තොරතුරු

**වැඩිදුර තොරතුරු සඳහා:**

- 1300 136 775 අංකය ඔස්සේ Tobacco Information Line  අමතන්න
- tobacco reforms website <www.health.vic.gov.au/tobaccoreforms>.වෙත පිවිසෙන්න

2001 අගෝස්තු 1 වන දින සිට ඇති නීතියේ නිශ්චිත පද යෝජනය බැලීමට වික්ටෝරියානු රජයේ  legislation website <www.legislation.vic.gov.au>  වෙබ් අඩවියට පිවිස *Tobacco Act 1987* පිරික්සන්න.

මෙම ප්‍රකාශනය වෙනත් ආකෘතියක ලබාගැනීමට 1300 136 775 අංකය ඔස්සේ Tobacco Information Line අමතන්න. අවශ්‍ය නම් 13 36 77 හරහා National Relay Service අමතන්න. නැතහොත් ඊමේල් මගින් tobaccopolicy@health.vic.gov.au අමතන්න.

වික්ටෝරියානු රජය මගින් අනුමත කර ප්‍රකාශ කරන ලදී.
Victorian Government, 1 Treasury Place, Melbourne.

© State of Victoria, May 2017.

**වියාචනය:** මෙම කරුණු පත්‍රිකාවේ අඩංගු උපදෙස් සාමාන්‍ය මගපෙන්වීම සඳහා පමණක් බව කරුණාවෙන් සළකන්න.  මම කරුණු පත්‍රිකාවේ අඩංගු උපදෙස් භාවිතය නිසා ඇතිවන කිසිදු අලාභයක් හෝ හානියක් ගැන Department  of Health and Human Services  වගකීමක් භාර නොගනී.  මෙම කරුණු පත්‍රිකාවේ අඩංගු කිසිවක් නිසි නීති උපදෙස් සඳහා ආදේශයක් නොවේ.

ISBN: 978-0-7311-7162-0

ලබා ගත හැකි අඩවිය
www.health.vic.gov.au/tobaccoreforms

[1] World Health Organization 2005, *Waterpipe tobacco smoking: health effects, research needs and recommended actions by regulators*, World Health Organization, Geneva

[2] දඬුවම් ඒකක වසරක් පාසා දර්ශකගත කෙරේ. 2017-18 දී එක දඬුවම් ඒකකයක්  $158.57කි.